# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1640/17 - 2010 පෙබරවාරි 10 වැනි බදාදා - 2010.02.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. — බී. 104/44.

### (87 වැනි අධිකාරය වූ) භාර ආඥාපනත

114 වැනි වගන්තිය යටතේ නියමය

" බිහිරි තැනැත්තන් සඳහාවන ආචාර්ය රයින්වස් පාසැල, භාරය" යන භාරයේ භාරකරුවන්, එනම්—

1. විනිසුරු ක්‍රිස්ටෝපර් ග්‍රෙගරි වීරමන්ත්‍රී මහතා ;
2. විනිසුරු ආචාර්ය ඇන්තනී රන්ජිත් බෙව්ස් අමරසිංහ මහතා ;
3. අම්බලංගොඩ ගුරුන්නාන්සේලාගේ ලක්ෂ්මන් පෙරේරා මහතා ;
4. චන්ද්‍රසෝම වික්‍රමපාල ගුණසේකර මහතා ;
5. උපාලි ඉන්ද්‍රජිත් පෙරේරා වික්‍රමරත්න මහතා ;
6. මාපලගම කෝට්ටගේ සුසිරිපාල ද සිල්වා මහතා ;
7. ක්‍රිස්ටිනා ජොසෆිනා මරියා ද සිල්වා මහත්මිය ;
8. විලි හෙන්ඩ්‍රික් මරියා එන්ග්බර්ස් මහතා ; සහ
9. ෆ්‍රැන්සිස්කා අමලියා මරියා මෙලීෆ් මහත්මිය

විසින් (87 වැනි අධිකාරය වූ) භාර ආඥාපනතේ 114 වැනි වගන්තිය යටතේ තමන් සංස්ථාගත කිරීම සඳහා අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ කටයුතු අමාත්‍යවරයා වෙත ඉල්ලුම් කර ඇති හෙයින් ;

ඉහත කී වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ කටයුතු අමාත්‍ය මිලින්ද මොරගොඩ වන මම, එකී භාරකරුවන් සංස්ථාගත කිරීමට මේ නියමයෙන් බලය දෙන අතර—

(අ) එකී සංස්ථාවේ රීති යටතේ සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් හිරන්ති අමරසේකර විසින් සහතික කරන ලද, 2009 පෙබරවාරි මස 13 වැනි දිනැති අංක 6921 දරන භාර ප්‍රකාශනය යටතේ යථා පරිදි පත් කරන ලද භාරකරුවන් සහ ඔවුන්ගේ තත්කාලීන අනුප්‍රාප්තිකයන් " බිහිරි තැනැත්තන් සඳහාවන ආචාර්ය රයින්වස් පාසැල, භාරය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු යයි ද ;

1A - G 12422— 380 (2010/02)

(ආ) එකී භාරකරුවන් විසින්, එකී නාමයෙන් සහ අභිධානයෙන් , කවර හෝ විස්තරයකට අයත් චංචල හෝ නිශ්චල දේපළ, එකී භාරය වෙනුවෙන් මිළදී ගැනීම, භාර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම, විකිණීම, හුවමාරු කිරීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැකි යයි ද ;

(ඇ) එකී භාරය හා සම්බන්ධ සියලු නඩු නිමිතිවල දී සහ නඩුවල දී ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර හෝ අධිකරණයක දී එකී නාමයෙන් සහ අභිධානයෙන් එකී භාරකරුවන් විසින් නඩු පැවරීමට, උත්තර දීමට හෝ විත්තිවාචක ඉදිරිපත් කිරීමට ද, ඔවුන්ට විරුද්ධව නඩු පවරනු ලැබීමට, උත්තර දෙනු ලැබීමට හෝ විත්තිවාචක ඉදිරිපත් කරනු ලැබීමට ද නීතියෙහි ලා හැකියාව හා බලය ඇත්තේ යයි ද

විධාන කර ප්‍රකාශ කරමි.

මේ නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීම, නැතහොත් අවශ්‍ය යයි මට පෙනී යන ආකාරයකින් එය කලින්කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම, මා විසින් කරනු ලැබිය හැකි ය.

මිලින්ද මොරගොඩ,
අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ කටයුතු අමාත්‍ය.

2009 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ,
අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

02-587

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.